# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - අභ්‍යන්තර කටයුතු ඒකකයේ ක්‍රියාකාරී සැලැස්ම

| අංකය | ක්‍රියාකාරකම | වගකීම | අවසන් කිරීමේ දිනය | ඇස්තමේන්තු කළ වියදම | අවශ්‍ය සහය | ප්‍රධාන කාර්ය සාධක දර්ශකය | සටහන |
|---|---|---|---|---|---|---|---|
| 1 | ආරක්ෂිත කැමරා සවි කිරීම | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්(පාලන) | - | ඇස්තමේන්තුගත කර නැත. | ශ්‍රී ලංකා පොලීසියේ තොරතුරු තාක්ෂණ අංශයේ සහය | ලැබෙන පැමිණිලි සංඛ්‍යාව අවම වීම | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සතුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 50 ක් ඇත. මෙහිදී පවතින නීත්‍යානුකූල ලේඛන පරිහරණය කරනු ලබයි. එහිදී විශාල බාහිර පාර්ශවයන් වෙත පරිශීලනය සඳහා ලේඛන ලබා දීඇත. මෙම බාහිර පාර්ශවයන් අධීක්ෂණය කිරීමට රජයේ නිලධාරීන් ඉතා සීමිතයි.එබැවින් මෙම ලේඛන පරීක්ෂා කිරීමේදී එම ලේඛන වලට යම්කිසි හානියක් සිදුවීමට ඉඩකඩ වැඩිය. එම පුද්ගලයින් නීතියේ රැහැනට හසු කර ගැනීමට ආරක්ෂිත කැමරා සවිකර යුතුය. ඊට අතිරේකව කාර්යාලයේ සේවය කරන රාජ්‍ය නිලධාරීන් විශාල පිරිසක් පරිහරණය කරන බැවින් ඔවුන්ගේ මැදිහත් වීම සිදුවේ නම් එය මැඩ පැවැත්විමට ආරක්ෂිත කැමරා සවි කිරීම වැදගත් වේ.දැනටමත් ආරක්ෂිත කැමරා සවිකර ඇතත් එම කැමරා 2026 වසරේදී උසස් තාක්ෂණයෙන් යුක්ත කැමරා පද්ධති සවිකිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසියේ තොරතුරු තාක්ෂණ සහාය මෙන්ම ආරක්ෂිත කැමරා සපයන ආයතන වල නිලධාරීන් සමඟ සාකච්ඡා කර ඇත. |
| 2 | ඇඟිලි සලකුණු යන්ත්‍ර සවි කිරීම | ගණකාධිකාරි සැපයුම් | 2025.12.15 | රුපියල් ලක්ෂ 2 | | නිලධාරීන්ගේ පැමිණීම ,පිටවීම නියමිත වේලාවට සිදුවු බව සහතික කිරීම මඟින් ආයතනය තුල දූෂණ සහ අක්‍රමිකතා නැති කිරීම | ප්‍රධාන කාර්යාලය ඇතුළුව සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල, කලාප හා දිස්ත්‍රික් කාර්යාල,මධ්‍යම ලේඛනාගාරයේ මේ වන විට ඇඟිලි සගකුණු යන්ත්‍ර සවිකර අවසන්ව ඇත. |
| 3 | ඊ- ඉඩම් සේවාව | සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්(ඊ-ඉඩම්) | 2027.12.31 | රුපියල් මිලියන 1648 | රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය , නීතිපති දෙපාර්තමේන්තුව,තොරතුරු තාක්ෂණ අංශය | ඉඩම් ලියාපදිංචි කාර්යාල 50 සඳහාම ඊ- ඉඩම් මෘදුකාංගය ස්ථාපනය කර අවසන් කිරීම | දෙපාර්තමේන්තුවේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල තුල සිදු වන්නේ ලේඛන ලියාපදිංචි කිරීමයි.එහිදී ලේඛන ලියාපදිංචියට ප්‍රමුඛතාවයක් හිමිවේ. වර්තමාන ලියාපදිංචි ක්‍රමවේදය තුල ලේඛන ලියාපදිංචියට ප්‍රමුඛ තාවයක් හිමි වේ. එම ක්‍රමවේදය තුල ලේඛන ලියාපදිංචියට භාරගැනීමේදී මෙන්ම ලියාපදිංචි සටහන් වල වෙනස් කිරීම්,පත්තඉරු කඩා ඉවත් තකිරීම් ,පත්ඉරු අස්ථානගත කිරීම් වැනි බොහෝ දූෂණ අක්‍රමිකතා සිදුවීමට ඉඩකඩක් පවතී. ඊ ඉඩම් මෘදුකාංගය ස්ථාපනය කිරීම තුලින් ව්‍යාජ ලේඛන ලියාපදිංචියට භාර දීමේ පටන් ඉහත කි අක්‍රමිකතා සිදු වීම වැළැක්වීම සඳහා මෘදුකාංගය තුල අභ්‍යන්තර ආරක්ෂිත සැකැස්මක් ක්‍රියාත්මක වේ. තවද ඊ මෘදුකාංගය තුළින් ලියාපදිංචි සටහන් පරිලෝකනය කිරීම හා එම පරිලෝකන පිටපත් මෘදුකාංගය තුලින් සහතික කර ලබා දීමට හැකියාව පවතින බැවින් ව්‍යාජ ලේඛන ලියාපදිංචිය මෙන්ම ඒ හා බැඳී පවතින සියලුම දූෂණ අක්‍රමිකතාවයන් වැළැක්වීමට ඉඩ සැලසේ. |
| 4 | ඊ- ජනගහන සේවාව ක්‍රියාත්මක වීම | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්(සිවිල්) | 2027.12.31 | රුපියල් මිලියන 34 | රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය , නීතිපති දෙපාර්තමේන්තුව,තොරතුරු තාක්ෂණ අංශය | උප්පැන්න, විවාහ සහ මරණ සහතික ලියාපදිංචි කිරීම සහ නිකුත් කිරීම | දැනට පවතින සාමාන්‍ය අතින් ලිවීමේ ක්‍රමවේදය තුලින් ව්‍යාජ සහතික මහජනයා අතට යාම වැලැක්කවීමට සහ දෙපාර්තමේනතුව සතුව විවාහ, උප්පැන්න මරණ ලියාපදිංචියට සම්බන්ධ යාවත්කාලීන දත්ත සටහන් ඕනෑම අවස්ථාවක ලබා ගැනීමට මෙන්ම වයස අවු. 16 සම්පූර්ණ වන අවස්ථාව වන විට නිකුත් කරනු ලබන ජාතික හැඳුනුම්පත සඳහා යොදා ගනු ලබන ජාතික හැඳුනුම්පත් අංකය ඊ ජනගහන වැඩසටහන යටතේ නිකුත් කරනු ලබන උප්පැන්න සහතිකයක උප්පැන්න සහතික අංකය ලෙස එම අවස්ථාවේම ලබා ගත හැකි වීම. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 5 | පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්(පාලන) | 2025.11.15 | කාර්ය අවසන් | දෙපාර්තමේන්තු ගත කාර්යයකි | 2026 දෙවන කාර්තුව අවසාන වීමට පෙර කලාප හා දිස්ත්‍රික් කාර්යාල වල පුරවැසි ප්‍රඥප්තිය නිකුත් කර ප්‍රදර්ශනය කිරීම හා නියමිත දිනට සේවාව සැපයීමට හැකි වීම. | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වල හා දිස්ත්‍රික් හා කලාප කාර්යාල වල සාමාන්‍ය සේවා මෙන්ම එක් දින කඩිනම් සේවා ක්‍රියාත්මක වේ මේ තුලින් ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා මෙන්ම ඔප්පු පිටපත් මෙන්ම පත්ඉරු ලබා ගැනීමට ගන්නා කාලය නිශ්චිතව දැක්වීම තුලින් නියමිත දිනට අදාළ සේවාව මහජනයා වෙත ලබා දීමට හැකි වීම මෙන්ම මහජනයාට පෙරලා ප්‍රශ්න කිරීමට හැකියාවක් ලැබීම. |
| 6 | දැන්වීම් පුවරු, සටිකර් පත් මුද්‍රණය කිරීම | ගණකාධිකාරි සැපයුම් | 2025.09.30 | කාර්ය අවසන් | | සියලුම කාර්යාලවල දූෂණ වැළැක්වීම සහ මහජනයාව  දැනුවත් කිරීම සහ නිත්‍යානුකූලව | අල්ලස් හා දූෂණ වැළැක්වීම සඳහා අභ්‍යන්තර කටයුතු ඒකකයේ දුරකථන අංකය ,ෆැක්ස් අංකය,වට්ස්ඇප් අංකය,විද්‍යුත් ලිපිනය සහිතව ස්ටිකර් පත් සහ දැන්වීම් පුවරු සියළුම කාර්යාලයන් සඳහා ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර ඇත. |